වෙළුම අංක 20 | කලාපය. 02 | ඔක්තෝබර් 2024

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

# INFORMATION





# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අවශ්‍යතාවය

මේ අපගේ 30 වන සංවත්සරයයි. ශ්‍රී ලංකාවේ සභා නායකයින්ව, දේවධර්මයෙන් සන්නද්ධ කරනු වස් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දොරවල් විවර වූයේ 1994 වසරේ මැයි 31 වනදාය. එය කාගේත් සිත් ගන්නා කතන්දරයක් බව මා කිය යුතුය. එදා එක ශිෂ්‍ය මධ්‍යස්ථානයකින් ආරම්භ වූ අතර, අද වනවිට එය මධ්‍යස්ථාන දහයක් දක්වා වර්ධනය වී ඇත. එදා සිටියේ සිසුන් 40ක් වුවත්, අද වන විට සිසුන් 800 ක් පමණ ඉගෙන ගනිමින් සිටිති. 1997 දී සිසුන් 17 කින් සමන්විතව තිබුණු උපාධිධාරී පන්තිය, 2023 වන විට ආදි ශිෂ්‍යයින් 824 දක්වා වර්ධනය වී ඇත!

මැයි සිට ජූලි දක්වා පැවැත්වුණු උත්සවයන් වලින්, ශාස්ත්‍රාලයේ වර්ධනය පිළිබඳ මෙම අපූරු දර්ශක අපි ප්‍රීතියෙන් සැමරුවෙමු. කෙසේ වෙතත්, මම තවමත්, ඒත් ඇයි? කියන ප්‍රශ්නය අසන්නෙමි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය අවශ්‍ය වන්නේ ඇයි? ඉදිරි වසර 30 සඳහා කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය අවශ්‍ය වන්නේ ඇයි? කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය අවශ්‍යතාවය පිළිබඳව මම දකින හේතු කිහිපයක් මෙහි සඳහන් කරන්නට කැමැත්තෙමි.

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය අවශ්‍ය වන්නේ සුභාරංචිය අවශ්‍ය නිසාය**

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය ගමනාන්තය නොවේය. දේවධර්ම අධ්‍යාපනය තිබෙන්නේ,

විදුහල්පතිතුමාගේ පණිවිඩය



## අයිවෝ පූබාලන්, PhD

විදුහල්පති

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය ශ්‍රී ලංකාව තුළත්, සියළු ජාතීන් අතරේත්, ප්‍රකාශ කිරීම සඳහා සභාවට සේවය කරන පිණිසය. මෙම උද්යෝගය බෙදාගත් පුරුෂයින් සහ ස්ත්‍රීන් එහි නිර්මාතෘවරයන් විය. ලෝකයට කිතුනු දහම ගෙන යෑමේ කැඳවීම තව දුරටත් රැගෙන යෑම අපගේද උනන්දුව බැවින්, විශිෂ්ඨ දේවධර්ම අධ්‍යාපනය යුගයේ අවශ්‍යතාවයයි.

**කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය අවශ්‍ය වන්නේ සභාව අවශ්‍ය නිසාය**

නයිසින් ඇද්හිල්ලේ ක්‍රමය පවසන ආකාරයට, අප විශ්වාස කරන්නේ එකම, ශුද්ධ, කතෝලික සහ අපෝසතලික සභාවය. මුළු ශ්‍රී ලාංකේය සභාවම ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය සහ මනාලිය ය. මේ නිසා, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, සියළු කිතුනු සම්ප්‍රදායන් වලට ගරු කරන සහ ඕනෑම කිතුනු නිකායක ඇදහිලිවන්තයින්ව සාදරයෙන් . . .

වැඩිදුර කියවන්න

## නිවේදනය!

### උපදේශනය පිළිබඳ උසස් සහතිකය (ACC)

### උපදේශන පිළිබඳ ඩිප්ලෝමාව (DIPLOMA) දක්වා උසස් කරන ලදී



CTS විසින් 2025 වර්ෂයේ සිට, උපදේශනය පිළිබඳ උසස් සහතිකය වෙනුවට උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව පිරිනමනු ඇත!

ආසියා දේවධර්ම සංගමයේ (ATA) මෑතකාලීනව සිදුකරන ලද ප්‍රතීතනයෙන් පසුව, දැනට ලබා දෙන ඉංග්‍රීසි මාධ්‍යයෙහි උසස් සහතිකය (ACC) ඩිප්ලෝමාව (Diploma) දක්වා උසස් කිරීමට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය හට අනුමැතිය ලැබිණි. මෙම ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම සඳහා සම්මාන 72ක් අවශ්‍ය වේ.

# ප්‍රජා සැමරුම් දිනය!





ජූනි 7, 2024 - සිසුන්, ගුරුවරුන්, සහ කාර්ය මණ්ඩලය හෙන්රි පේද්‍රිස් පිටියේදී එකට එකතු වී ක්‍රීඩා, ආහාර, සහභාගිකත්වය සහ සුහද තරඟ වලින් සමන්විත විනෝදජනක දිනයක් ගත කරන ලදි. අන්තර්ජාලය ඔස්සේ සහ පංති කාමරය තුළ, භාෂා මාධ්‍ය තුනකින් ඉගෙන ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එකට එකතු වී, නිකායන් හරහා මිත්‍රත්වයන් ගොඩ නංවා ගැනීමට ඉන් විශේෂ අවස්ථාවක් සැලසුණි. එහිදී රැස්ව සිටි අය ඇමතූ විදුහල්පති, ආචාර්ය අයිවෝ පූබාලන්, කියා සිටියේ, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අධ්‍යාපනය හුදෙක් දේවධර්ම දැනුමට පමණක් සීමා වූවක් නොවන බවය. චරිත වර්ධනය සහ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ බිත්ති වලින් ඔබ්බට එකිනෙකාට සහයෝගය දෙන ප්‍රජායකට අයත් වීමත් ඊට ඇතුළත් බව එතුමා කියා සිටියේය.









## දෙවිඳුන් අප සමඟයි

මෙය කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සිසුන් සහ ගුරුවරුන්ගේ නිර්මාණයකි. භාෂා තුනෙන්ම ගැයෙන මෙම ගීතය 2 වන වාරයේ අවසාන දේව මෙහෙයේදී ගායනා කරනු ලැබීය. මෙය ගීතාවලිය 46 මත පදනම්ව, පසුගිය වසර 30ක කාලය තුළ, දෙවියන් වහන්සේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කරන ලද සියල්ල සිහිපත් කරන්නකි.

Click Here

මෙම ගීතයට සවන් දීම සඳහා මෙම යූ ටියුබ් දාමය හා සම්බන්ධ වන්න.




### විශ්වාසවන්ත සේවයේ සන්ධිස්ථාන සළකුණු කිරීම

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන

ශාස්ත්‍රාලය අග නුවර වර්ධනය වන අතරම, දේශයේ වෙනත් ප්‍රදේශ වල නායකයින් සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය අතපසු කළ නොහැකි විය. අදාළවීමට හා ප්‍රතිචාරාත්මක විමට ඇති කැපවීමට අනුකූලව, 2001 වසරේදී කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය උතුරු පළාතේ සභා නායකයින් සන්නද්ධ කිරීමට සහ ඇදහිලිවන්තයින් ශක්තිමත් කිරීමට නිර්භීත පියවරක් ඉදිරියට තැබුවේ යුද්ධය අතරතුරදීමය. 2005 වන විට, සුනාමියෙන් විනාශවූ දක්ෂිණ පළාතේ නායකයින් සන්නද්ධ කිරීමේ කැඳවීමටත් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය ප්‍රතිචාර දක්වන ලදි.

**30 වසරක ගමනේ සන්ධිස්ථාන**


උතුරු පළාත

අද වනවිට, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය පළාත් නවයෙන් හයකම ක්‍රියාත්මක වන අතර, සෙසු පළාත් වලටද, අන්තර්ජාල විෂයන් ඔස්සේ ළඟාවී ඇත. පළාත් නවයේම සිටින ඇදහිලිවතුන් වෙතට, දේවධර්ම අධ්‍යාපනය ගෙන යෑම කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අභිලාෂයයි.


දකුණු පළාත


නැගෙනහිර පළාත

# ඉගෙන ගන්නා ප්‍රජාව පෝෂණය කිරීම

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාල මූලස්ථානයේ දී ඉගැන්වූ බාහිර කථිකාචාර්යවරුන්

ඇදහීම, සමාජය, සහ සමාජ සාධාරණය



(ශාස්ත්‍රපති උපාධිය)
ආචාර්ය ස්ටීවන් බේලි

පංච පුස්තකය



(ශාස්ත්‍රපති උපාධිය)
ආචාර්ය ජූලි වුඩ්ස්

නව ගිවිසුමේ දේවධර්මය



(ශාස්ත්‍රපති උපාධිය)
අළුත් ගිවිසුම පිළිබඳ කීර්තිමත් මහාචාර්ය, ආචාර්ය එක්හාර්ඩ් ෂ්නාබෙල්

දරුවන් සහ පවුල් සඳහා එඬේර සේවාව



(කෙටි කාලීන පාඨමාලාව)
දේවගැති, උපදේශක සහ පුහුණුකරු, ආචාර්ය ඩේවිඩ් සී ගුඩ්වින්

## ශාස්ත්‍රපති උපදේශන විෂය ධාරාවේ කම්පනය සම්බන්ධ විශේෂ සම්මන්ත්‍රණය

**කම්පනය සහ අවදානම සඳහා උපදේශනය**

මහාචාර්ය, උපදේශක සහ කර්තෘ, ආචාර්ය ටැමී ෂුල්ට්ස් සමඟ ශාස්ත්‍රපති උපදේශන පාඨමාලාව.



ආචාර්ය ටැමී ෂුල්ට්ස් සහ පාඨමාලා සම්බන්ධීකාරක, දිලීනි ඒබ්‍රහම් සමඟ ශාස්ත්‍රපති (උපදේශන) සිසුන්.

උපදේශකයින්, සභා පාලකවරුන් සහ සභා නායකයින්ට කම්පනය ගැන වැඩි අවබෝධයක් ලබා දෙන පිණිස විශේෂ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.



සහභාගිවූවන් බයිබලයේ කම්පනය ගැන තිබෙන කතිකාව සෝදිසි කර බැලූ අතර, සාකල්‍ය සුවය ලබා දීම සඳහා ගත හැකි ප්‍රවේශ සාකච්ඡා කරන ලදී. තවද, ඔවුන්ට පශ්චාත් කම්පන වර්ධන අභ්‍යාසද ඉගෙනීමට ලැබුණි.

## ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය: ළමා සේවා ක්ෂේත්‍ර වැඩමුළුව

ළමා සේවා ක්ෂේත්‍ර වැඩසටහන සඳහා ලියාපදිංචි වූ 86 දෙනෙක්ගෙන් සමන්විත, තුන්වන ශිෂ්‍ය කණ්ඩායම, අගෝස්තු මාසයේ දී, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ අගනුවර ශාඛාවේ දින දෙකක් ගත කරමින්, ඔවුන්ගේ පළමු ස්ථානගත වැඩමුළුවට සහභාගි වූ අතර, තම සහෝදර ශිෂ්‍යයින් සහ ගුරුවරුන් සමඟ සහභාගිකත්වය පැවැත්වූහ.



සිංහල හා දෙමළ මාධ්‍ය පන්තිවල සිසුන් ඔවුන්ගේ කථිකාචාර්යවරුන් සහ පාඨමාලා සම්බන්ධීකාරක ක්‍රිස්නි විදිර්සිංහ සමඟ.

වැඩමුළුවෙන් අධ්‍යයන ක්‍රමවේද, අධ්‍යාත්මික හික්මවීම, කාල කළමනාකරණය සහ භාරකාරත්වය යන ක්ෂේත්‍රවලට අවධානය යොමු කරන ලදී. ඉගෙන ගැනීමේ සම්පතක් ලෙස, පුස්තකාලය භාවිත කරන අන්දම ගැන සිසුන්ට ප්‍රායෝගික පුහුණුවක් ලැබුණි.

මේ සඳහා හම්බන්තොට, නුවරඑළිය, කිලිනොච්චිය, මඩකලපුව, කොළඹ, ගම්පහ, බදුල්ල, බණ්ඩාරවෙල, ඇඹිලිපිටිය යන ප්‍රදේශවලින් සිසුන් පැමිණ සිටියහ.

සම්පූර්ණයෙන්ම අන්තර්ජාලය ඔස්සේ පවත්වන මෙම වැඩසටහනින්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ව ඔවුන්ගේ ප්‍රාදේශීය පසුබිම තුළ, ළමුන්ට සහ පවුල්වලට වඩාත් ඵලදායී සේවාවක් ඉටු කිරීමට සන්නද්ධ කරයි.

## දේවධර්මීය අධ්‍යාපනඥයින් සඳහා ගෝලීය සංගමය (GATE) විසින් පවත්වන ලද ගුරු පුහුණුව

### දේවධර්මීය අධ්‍යාපනඥයින් සඳහා ගෝලීය සංගමය (GATE) විසින් පවත්වන වසර 4ක ගුරු පුහුණු වැඩ සටහන

දේවධර්මීය අධ්‍යාපනඥයින් සඳහා ගෝලීය සංගමය (GATE) විසින් පවත්වන ලද පුහුණුව සඳහා කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ගුරුවරුන් සමඟ ශ්‍රී ලංකාවේ තවත් ශාස්ත්‍රාල සහ බයිබල් විදුහල් හතරක ගුරුවරුන් සහභාගි වූ අතර, එය ඔවුන්ට මහඟු ආශිර්වාදයක් විය. ආසියානු දේවධර්ම සංගමයේ (ATA) දායකත්වයෙන් දේවධර්ම ගුරුවරුන් 61 දෙනෙක් මෙම පුහුණුවට සහභාගි විය. මේ සඳහා පහසුකම් සපයන්නන් ලෙස ආචාර්ය තෙරේසා ලුවා, ආචාර්ය ගැරී ග්‍රිෆිත් සහ ආචාර්ය බෙනට් ලෝරන්ස් සහභාගි විය. කාණ්ඩ හතරකින් සමන්විත මෙම පුහුණුවේ පළමු කාණ්ඩය සඳහා සත්කාරකත්වය ලබා දීමට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට ප්‍රස්ථාවක් ලැබුණි.








## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පුස්තකාලයට ආචාරය රැල්ෆ් ඩේවිස්ගෙන් ලැබුණු ත්‍යාගය

ආචාර්ය ඩේල් රැල්ෆ් ඩේවිස් ඔහුගේ 80 වන ජන්ම දිනය නිමිත්තෙන්, ඔහු විසින් රචිත පොත් එකතුවක්, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට ලබා ගැනීමට හැකි වීම විශේෂ වරප්‍රසාදයක් විය. ආචාර්ය ඩේවිස් වඩාත්ම කියවිය හැකි සහ විශ්වසනීය ශුද්ධ ලියවිලි අර්ථ විග්‍රහයෙකු / විචාරකයෙකු ලෙස හැඳින්වේ. ඔහු දේශනා සඳහා නිදර්ශන දීමේ සහ අර්ථ විග්‍රහ කිරීමේ අති දක්ෂයෙක් ලෙසද විස්තර කර ඇත. ඔහු මේ වනවිට විශ්‍රාම ගොස් සිටියද තවත් විචාර ලියමින් සිටී.






කථිකයා - ආචාර්ය ප්‍රබෝ මිහිඳුකුලසූරිය

අධ්‍යයන සම්මන්ත්‍රණය

## ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කිතුනුවන් දායක වූ අන්දම

මැයි මාසයේ පැවැත්වූ විශේෂ සම්මන්ත්‍රණයකදී, ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කිතුනුවන් දායක වූ අන්දම පිළිබඳව ආචාර්ය ප්‍රබෝ මිහිඳුකුලසූරිය විසින් සිදුකරන ලද පර්යේෂණය වාර්තාව ඉදිරිපත් කරන ලදි. එම ඉදිරිපත් කිරීම සහ සාකච්ඡාව ඔහුගේ ආචාර්ය උපාධි නිබන්ධනය මත පදනම් විය. 1915 දී ක්‍රියාත්මක වූ, ලාංකික ජාතිකවාදී 'යුක්තිය වෙනුවෙන් උද්ඝෝෂනය' සඳහා බ්‍රිතාන්‍ය ක්‍රිස්තියානි මානුෂීය සංවිධානවල දායකත්වය එහි තේමාව විය. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හිටපු නියෝජ්‍ය විදුහල්පති සහ පූර්ණකාලීන ගුරු සාමාජිකයෙක් ව සිටි ආචාර්ය මිහිඳුකුලසූරිය, මේ වනවිට, කැනඩාවේ රීජන්ට් විශ්ව විද්‍යාලයේ ක්‍රිස්තියානි ධර්මයේ ඉතිහාසය පිළිබඳ සහකාර මහාචාර්යවරයා ලෙස සේවය කරයි. ඔහු කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශාස්ත්‍රීය සඟරාවේ (JCTS) සංස්කාරකවරයා ලෙසත්, අනුබද්ධ ගුරු සාමාජිකයෙකු ලෙසත් සේවය කරයි.




## සිව්වන ලෝසාන් සම්මේලනයේදී කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය නියෝජනය වීම

කවුන්සිල, ගුරු මණ්ඩල, කාර්ය මණ්ඩල, ශිෂ්‍යයින් සහ ආදි සිසුන් කිහිප දෙනෙක්, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය නියෝජනය කරමින්, සැප්තැම්බර් මාසයේදී, දකුණු කොරියාවේ පැවැත්වූ ලෝක එවැන්ජලිස්තකරණය පිළිබඳ සිව්වන ලෝසාන් කොන්ග්‍රසයට සහභාගි විය. එම කොන්ග්‍රසයේදී ප්‍රකාශයට පත් කෙරුණු 'සෝල් ප්‍රකාශනය' වර්ධනය කිරීමට දේවධර්ම ක්‍රියාකාරී කණ්ඩායමේ සම සභාපති ලෙස කටයුතු කරන ආචාර්ය අයිවෝ පූබාලන්ද දායක විය. මූලික විශ්වාසයන් විස්තර කරමින්, සමකාලීන අභියෝග ආමන්ත්‍රණය කරන මෙම ලියවිල්ල එවැන්ජලිස්ත ක්‍රිස්තියානි ධර්මයේ තීරණාත්මක ලියවිල්ලකි.

# CTS ප්‍රජාව

**ශිෂ්‍ය කතා**

## ඔද්දමවාඩිඃ නොපැවසූ කතන්දරය

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ආදි ශිෂ්‍යයෙක් සහ දැනට ශාස්ත්‍රපති අපේක්ෂිකාවක් වූ රෝෂනාරා ද මැල් 'ඔද්දමවාඩිඃ නොපැවසූ කතන්දරය' 'ODDAMAVADI: THE UNTOLD STORY' නැමැති ග්‍රන්ථයේ කතෘවරියයි. කොවිඩ්-19 වසංගත සමයේ දී, වෛරසයට ගොදුරු වූ සිය ආදරණීයයන් ආදාහනය කිරීමට බල කිරීම නිසා ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාවට මුහුණ දීමට සිදුවූ ගැටළු මෙම ග්‍රන්ථයෙන් පාඨකයා වෙත ගෙන එයි. යළි මෙවැන්නක් අනාගතයේ කිසිදාක සිදු නොවන පිණිස, මෙම ඛේදවාචකයේ සත්‍ය කතාව මේ වන විට, ලිඛිත මාධ්‍ය, ඡායාරූප සහ චිත්‍රපට හරහා ඉදිරිපත් කර ඇත.






> "මුළ පටන්ම ඔද්දමවාඩි පූජනීය කටයුත්තක් ලෙස දැනුණි. එය හඬක් නැති අය වෙනුවෙන් හඬක් නැගීම සඳහා ලිවීමේ හැකියාව භාවිත කිරීමට අවස්ථාවක් විය. කොවිඩ්-19 වසංගත සමයේ දී, එවකට රජය විසින් ක්‍රියාත්මක කළ වෙනස් කොට සැලකීමේ, අසාධාරණ ප්‍රතිපත්ති නිසා මුස්ලිම් ජනතාවට මුහුණ දීමට සිදුවූ තත්වය කරලියට ගෙන ඒමක් මෙයින් සිදුවේ. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය මාගේ සිතේ තදින්ම සනිටුහන් කර ඇති අන්දමට, යුක්තිය, සත්‍යතාවය සහ අනුග්‍රහය වෙනුවෙන් දෙවියන් වහන්සේ විසින් අපට දී ඇති දීමනා භාවිත කළ යුතු යයි සිතමි. මෙම ව්‍යාපෘතියට මාව ගෙන ආ දෙවියන් වහන්සේ මාව අවසානය දක්වා රැගෙන ආ සේක. බලාපොරොත්තු කඩවී වෙහෙසට පත්ව අත්හැරීමට පෙළඹුණු සෑම අවස්ථාවකම උන්වහන්සේ මාව දිගටම රැගෙන ගිය සේක. උන්වහන්සේටම ගෞරවය වේවා!"

අප කවුරුත් රෝෂි ලෙස ආමන්ත්‍රණය කරන ඇය, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රවර්ධන හා ප්‍රචාරක සම්බන්ධීකාරක ලෙස 2019 සිට 2024 ජූනි මාසය තෙක් ක්‍රියා කළාය. ප්‍රචාරක උපාය මාර්ග, විෂය අන්තර්ගත ලිවීම සහ ප්‍රවර්ධන සඳහා විවිධ මාධ්‍යයන් සංවර්ධනය කිරීමට නායකත්වය දෙමින් ඇය කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ මෙහෙයුම සඳහා ඉමහත් සේවයක් සපයන ලදි. ඇයගේ මගපෙන්වීම යටතේ තිභාෂා පුවත් ලිපිය සහ පාඨමාලා නාමාවලිය එළි දක්වන්නටද හැකියාව ලැබුණි. සිය අධ්‍යාපන කටයුතු නිම කරමින්, තම වෘත්තීය මාවතේ ඉදිරියට යන රෝෂිට අපි දෙවියන් වහන්සේගේ ආශීර්වාදය පතමු.

**සමුගැනීම්**

### රොජර් ස්ලෙමර්මන්



රොජර්, නැත්නම්, 'අංකල් රොජර්' ලෙස සෙනෙහසින් අමතන ලද ඔහු, වසර 20ක් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සේවය කළේය. ඔහු කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට දැක්වූ විශ්වාසවන්තභාවය සහ නිතරම අත හිත දීමේ ගතිය කවුරුත් දන්නා කරුණකි. ඔහු කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයට කරන ලද ආයෝජන අපි අතිශයින් අගය කරමු. දෙවියන් වහන්සේගේ නිරන්තර සමීපත්වය සහ ආශිර්වාද ඔහුට සහ පවුලේ සැමට ලැබේවා ය යනු අපගේ යාච්ඤාවයි.

## කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙත දීම

**1 බැංකු ප්‍රේෂණ සහ විදේශ මුදල් යැවීම (ඇ.ඩො. සහ කැ.ඩො)**

වැඩි විස්තර සඳහා අප අමතන්න

**2 ණයවර පත (ක්‍රෙඩිට් කාඩ්)**

**CTS වෙබ් අඩවිය හරහා ගෙවීම් කරන්නට**

WWW.CTS.LK වෙත පිවිසෙන්න
|
පිටුවේ ඉහළ දකුණේ තිබෙන 'GIVE TO CTS' බොත්තම ඔබන්න
|
පරිත්‍යාග කරන්න

**3 චෙක්පත්**

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ **නමට ලියන්න** (ගෙවීම් ලබන්නා) විදුහල්පති, කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය, 189, දුටුගැමුණු වීදිය, කොහුවල, ශ්‍රී ලංකාව **වෙත එවන්න**

**4 මුදල් ගෙවීම්**

කොහුවල කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය මූලස්ථානය වෙත පිවිසෙන්න

වැඩි විස්තර සඳහා සම්පත් සංවර්ධන කළමනාකාර, රොෂෙල් හේකල්-රණසිංහ අමතන්න
+94 77 350 2930 | rochelle@cts.lk

WWW.CTS.LK | +94 11 2890809